# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2014 අංක 15 දරන මුදල් නීති (සංශෝධන)
## පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 අප්‍රේල් මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 අප්‍රේල් මස 25 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක්
වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**2014 අංක 15 දරන මුදල් නීති (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2014 අප්‍රේල් මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 13/2014.

**(422 වන අධිකාරය වූ) මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2014 අංක 15 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 6 වන වගන්තිය, ඒ වගන්තියේ "ඒ මුදල, ව්‍යවහාර මුදල් කොමසාරිස්වරුන්ගේ මණ්ඩලයේ වත්කම් අතිරික්තයෙන් බැංකුව වෙත මෙයින් හිමිකර දෙනු ලැබේ." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 422 වන අධිකාරයේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "ඒ මුදල, ව්‍යවහාර මුදල් කොමසාරිස්වරුන්ගේ මණ්ඩලයේ වත්කම් අතිරික්තයෙන් බැංකුව වෙත මෙයින් හිමිකර දෙනු ලැබේ:
>
> එසේ වුව ද, මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවෙහි මූල්‍ය පද්ධතියෙහි ශක්‍යතාවය සහ ස්ථාවරභාවය සැලකිල්ලට ගෙන, ජාතික ආර්ථිකයෙහි යහපත උදෙසා, කලින් කල, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මහ බැංකුවේ ප්‍රාග්ධනය රුපියල් බිලියන පනහක් නොඉක්මවන මුදල් ප්‍රමාණයකට වැඩි කරනු ලැබිය හැකි ය.".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—PL 008085—2,900 (2014/03)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.